

# විදු දකින දේශපාලන යථාර්ථය

ලක්ෂ්මන් කොඩිතුවක්කු

විදුට පියෙක් නැත. ඔහු අවජාතක දරුවෙකි. ශ්‍රී ලංකාවේ සංස්කෘතික පසුබිම අනුව ශුක්‍රාණුවක් සහ ඩිම්බයක් සංසේචනය වීමේදී එයින් හටගක්කා පදාර්ථ ඵලයට කඩදාසි කැබැල්ලක් නොහොත් උප්පැන්න සහතිකයක් තිබිය යුතුය. විදුගේ මව වරෙක ගණිකාවකි. වරෙක මහ මඟ පික් පොකට් ගසන්නියකි. විදු සිනමා පටය ආරම්භ වන්නේ පාසැලකිනි. විදුව පාසැලට ඇතුළත් කිරීමට යන මවට සිදුවන්නේ විදුව නැවත හරවාගෙනයාමටය. ඒ ඔහුට උප්පැන්න සහතිකයක් නැති බැවිනි.

චන්ද්‍රකින්නරී සිනමා සිත්තමෙන් තම සිනමා ජීවිතය ආරම්භ කළ අශෝක හඳගමගේ අළුත්ම සිනමා පටයයි විදු. අක්ෂරය චිත්‍රපටය නිසා ඔහුගේ සිනමා ජීවිතයට හා නිර්මාණ වල හිස ගසා දමන්නට තීරණය කළ අවි අමෝරාගත් මණ්ඩල වලට කිසිම ලෙසකින් විනාශ කළ නොහැකි බලය ඔවුන්ගේ නෙත් විවර කරන්නට විදු සමත් වී ඇත. මංමුලා වු දේශපාලන පසුබිමේ අතුරු ඵලයක් ලෙස හිරු එළිය දකින විදු ඉංග්‍රිසි ඉගෙන ගන්නේ වැල්ලේ සුද්දන්ගෙනි. පරාජය හමුවේ නොසැලෙන ඔහුගේ වීරත්වය කියාපාන්නේ වැල්ලේ කරක් ගසන සුද්දන්ගේ සහ විදුගේ රූප රාමු පෙළ අතරින් කියාපාන මුල් රාමු පෙළේ තිර නාටකය අතරින් විදු සුද්දා හමුවේ ජයග්‍රහණය කරන රූප රාමු පෙළ තුළිනි. විදුට අරමුණක් ඇත. ඔහු නින්දේදී සිහින දකින්නේ නැත. එය පාට පාට සිහිනයක් නොවේ.

විදු ළමා චිත්‍රපටයක් නොවේ. බොහෝ ප්‍රේක්ෂකයන් සිතා සිටියේත් එය නරඹන්නට පැමිණියේත් එය ළමා චිත්‍රපටයක් යැයි සිතාය. එය ළමුන් ලවා කතා කරවන, අපේ රටේ බංකොලොත් දේශපාලන ප්‍රවාහනය පිළිඹිඹු කරන කාටත් සිතන්නට යමක් ඉතිරි කරවන යථාර්ථවාදී සිනමා පටියකි. තමන්ගේ දේශපාලන අභිමතාර්ථයන් හමුවේ ළමුන් පමණක් නොව තිරිසනුන් වුවද අලෙවිකරන දේශපාලඥයන්ගේ අමන ක්‍රියාදාමයන් හමුවේ නොසැළෙන ළමා වීරයෙකුගේ කතාවකි. මුඩුක්කුවේ ජීවත්වන විදුගේ මවට ඇති එකම අවශ්‍යතාවය වන්නේ තම දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දී යහපත් පුරවැසියකු කිරීමයි. විදුගේ මව ගණිකාවක් කළේත්, පික්පොකට් ගසන්නියක් බවට පත් කළේත් කුහක දේශපාලනයයි. එදා සාමාන්‍ය මිනිසකු ලෙස ජීවත්වු දේශපාලඥයත් විදුගේ මවත් අතර තිබු ප්‍රේමය බැඳී තිබුණොත් රාගයෙන් පමණි. එකම එක දෙබස් කණ්ඩයකින් පමණක් ප්‍රේක්ෂකයාට කදිමට පැහැදිලි කරන

> *දේශපාලන අරමුණු හමුවේ බිලිගන්නා ළමා ලෝකය පිළිබඳ විවරණයක් තත්පර කිහිපයක රූප පෙළක් මතින් අපිට පෙන්වන හඳගම විදුගේ කතාව අපිට කතා කරන්නට ඉඩහැර සන්සුන් වෙයි.*

හඳගම ඊටපසු දරුවාත් මවත් සංවාදයකට භාජනය කරයි. එම සංවාදය හමුවේ මව පරාජයට පත්වුවත් දෙදෙනාටම ඇත්තේ එකම අරමුණකි. ඒ මේ ජීවිතය ජයගැනීමයි.

තම ගැඹුරු දේශපාලන සිනමා රීතිය තරමක් සරල කර ඇති හඳගම අවසානයේ ප්‍රේක්ෂකයාට පෙන්වන්නේ විදු සහ අප ජීවත්වන ප්‍රචණ්ඩකාරි මායාකාරි දේශපාලන ප්‍රවාහයයි. -අම්මට වටිනාකමක් තියෙනවද? අම්මගෙ නටිනාකම කීයද? විදු අසන ප්‍රශ්න වලට මවගේ පිළිතුර වන්නේ -සමහර වේලාවට මට මිළක් නැහැ මගේ වටිනාකම බිංදුවයි" යනුවෙනි. මුදලුත් බලයත් හමුවේ මාතෘත්වයට හිමි වටිනාකම කෙසේ මනින්නද? විදුගේ කඩිකත්වයේ වටිනාකම නිසා රැස්වීම් වලට සෙනඟ අද්දවා ගැනීමේ වටිනාකම ඉහළ ගොස් ඇති සමාජ තලයක මාතෘත්වය බිංදුවට නොව සත්ත අගයකට වුවද බැස්සවීමට දේශපාලඥයා මැලිවන්නේ නැත.

තම චලක රූප රාමු සිත් තුළ නොසැලෙන්නට ඉඩහැර ගලායාමට සලස්වා ඇති තිර නාටකය විදුගේ අගය තවත් ඉහළ නංවා ඇත. කිසි දිනෙක ගීතයක් තම චිත්‍රපටියකට ඇතුළත් නොකළ හඳගම විදු තුළින් අපට ගයන ගීතය තුළද ඇත්තේ සංගීතමය ආරෝපණයකි. කපිල පුගල ආරච්චිගේ සංගීතය තුළින් විදු දකින වීරයන්ගේ ලෝකය සුනු විසුනු වන්නේ පාසැලේදී විදු ඉදිරිපත් කිරීමට තිබු තම සහජ කඩිකත්වය ගිනි ගැනීම නිසාය. අවසානයේ විදුට කතාකිරීමට සිදුවන්නේ ප්‍රචණ්ඩත්වය විසින් හිස් කළ එහෙත් කිසිදා සොයාගත නොහැකි සැඟවු ගිනි ඇවිළී විනාශ වී ගිය වේදිකාවක් මතය. දේශපාලන අරමුණු හමුවේ බිලිගන්නා ළමා ලෝකය පිළිබඳ විවරණයක් තත්පර කිහිපයක රූප පෙළක් මතින් අපිට පෙන්වන හඳගම විදුගේ කතාව අපිට කතා කරන්නට ඉඩහැර සන්සුන් වෙයි.

විදු ලෙස රඟන ළමා නළුවාගේ රංගන ප්‍රතිභාව සේම ඔහු වීරයකු ලෙස දකින ළමා නිළියගේ රංගනය විදුට ගැලපෙන ලෙස මනාව උකහාගන්නට හඳගම සමත් වී ඇත. එලෙසම චාන්දනී සෙනෙවිරත්න, ගාමිණී හෙට්ටිආරච්චි හා සෞම්‍ය ලියනගේ යන ප්‍රතිභාපූර්ණ රංගන ත්‍රිත්වය චිත්‍රපටියට කදිම ආලෝකයක් වී ඇත.

දේශපාලඥයා ලෙස රඟන සෞම්‍ය ලියනගේ කුස්ගැබ අනවශ්‍ය ලෙස ඉහළට නෙරා ඒමේ කෘතිමබ වත් ප්‍රේක්ෂකයාට දැනුනද අපේ රටේ දේශපාලන යථාර්ථය තම රංගනය තුළින් උසස් ලෙස රංග නිර්මාණය කරන්නට සෞම්‍ය ලියනගේ සමත් වී සිටී.

විදුගේ ලෝකයේ වීරයා සොයාගෙන යන ගමනක කතාව අපේ රටේ ළමා පරපුරේ කතාවයි. බටහිර ලෝකයේ පුස්සත් වීරයන් ලෙස දකින සුපර් ස්ටාර්ලා, ක්‍රීඩා ස්ටාර්ලා, වීරයන් ලෙස දකින අපේ ළමා පරපුරට දවාලේ ඇස් වසා නොව, නින්දේදී නොව, මහමඟ දකින්නට සිහින ඉතිරි කරන විදු වරින් වර සංවාදයට භාජනය වු නිර්මාණ ඉදිරිපත් කළ හඳගමගේ සාර්ථක චිත්‍රපටියකි.

එහෙත් මම මේ ලිපිය අවසන් කරන්නේ අපේ ප්‍රේක්ෂකයන්ගේ ප්‍රශ්නයක් තුළිනි. එදා චන්ද්‍රකින්නරී නැරඹු ප්‍රේක්ෂකයෙක් මගෙන් ඇසුවේ, කෝ මේකේ කතාවක් නෑනෙ. ඔහෙ කෑලි ටිකක් අටවලනෙ මිනි පෙට්ටි වටේ දුවන මිනිස්සු ඉන්නවද? යැයි අසමිනි. අද විදු බැලු ප්‍රේක්ෂකයෙක් ඇසුවේ -හොඳ දෙයක් කියන්න හදනව. ඒ වුනාට ටිකක් තේරෙනවා මදි කතාවක් තිබ්බනම් හොඳයි" යනුවෙනි. නමුත් එදා පිළිතුරු නුදුන් මට අද එම ප්‍රේක්ෂකයන්ට මෙම ලිපිය තුළින් පිළිතුරක් දිය හැක. "හඳගම අපට සිතන්නට යමක් ඉතිරි කර ඇත. අප අවසානය තෙක් දුටුවේ එයයි" සංවාදශිලි යථාවාදි සිනමාවද එයමයි. අවසානය තීරණය කළ යුත්තේ ප්‍රේක්ෂක අපම ය.


